**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ තාක්ෂණික උපකරණ ඒකක 06 ක් වෙනුවෙන් වැය කරන ලද රු.136,125 ක් ජංගම වත්කම් තුළ ඇතුළත් කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | වත්කම්වල පැවැත්ම කෙරෙහි අවධානය යොමුකර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.472,423 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.3,661,202 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජල ආදායම රු.533,184 ක් අඩුවෙන්ද, කඩ කුලී ආදායම රු.28,767 ක් හා පොළ බදු කුලී ආදායම රු.3,583,197 ක් අඩුවෙන්ද මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට පැවත එන මහියංගණ ප්‍රාදේශීය සභාවේ ගල් රෝල සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.114,912 ක ණයහිමි ශේෂය සනාථ කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ණයහිමි ශේෂ සනාථ කර ගැනීමට උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂ රු.2,900,188 ක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | දිගුකාලීනව පැවත එන ණයහිමි ශේෂ කපා හැරීමට වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 104 (4) | සභාවට අයත් වාහන 06කට 2019, 2020, 2022 සහ 2023 වර්ෂ වලදී සිදුවූ අනතුරු සම්බන්ධව මු.රෙ ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පූර්ණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අනතුරු සම්බන්ධ පූර්ණ වාර්තා කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,469,115 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,827,035 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුවසමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,805,700 | 2,468,828 | 1,336,150 | 1,132,678 | 1,842,000 | 1,397,323 | 909,532 | 487,791 |
| (ii) | කුලී | 5,878,200 | 5,186,649 | 4,956,985 | 229,664 | 6,002,000 | 3,690,659 | 5,470,627 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,000,500 | 1,000,500 | 835,000 | 165,500 | 902,500 | 902,500 | 820,500 | 82,000 |
| (iv) | වෙනත් ආදායම් | 4,000,000 | 8,474,221 | 1,169,319 | 7,304,902 | 2,160,000 | 3,955,814 | 4,881,854 | - |
| | **එකතුව** | 12,684,400 | 17,130,198 | 8,297,454 | 8,832,744 | 10,906,500 | 9,946,296 | 12,082,513 | 569,791 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,436,391 ක් හා මුද්දර ගාස්තු රු.6,169,540 ක් ගෙන්වාගෙන නොතිබුණි. | උපලේඛන සකස් කිරීමට විෂය නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇකිරියන්කුඹුර ජල ව්‍යාපෘතියෙන් මහජනතාවට අඛණ්ඩ සහ ප්‍රමාණවත් ලෙස ජලය නොලැබීම හේතුවෙන් ජල පාරිභෝගිකයින් 50 කට දීර්ඝ කාලයක සිට ජල ව්‍යාපෘතියෙන් ජලය පරිභෝජනය කිරීමට නොහැකිවී තිබුණි. එමෙන්ම ජල ව්‍යාපෘතියට ජලය ලබා ගැනීමට ඇකිරියන්කුඹුර රෝහල් භූමියේ ඉදිකර තිබුණු නළ ළිඳෙහි ජල මෝටරය පැය 24 පුරාම ක්‍රියාත්මක කර තිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලයට ජල ව්‍යාපෘතියේ විදුලි ගාස්තු වශයෙන් රු.680,865 ක් වැය කර තිබුණි. ඒ අනුව මාසික සාමාන්‍ය විදුලි වියදම රු.75,651 ක ඉහළ අගයක් ගෙන ජල මෝටරය ක්‍රියාත්මක කර තිබුණද, ප්‍රමාණවත් ජල ධාරිතාවයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ජල පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 ආර්ථික නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) මූල්‍ය ප්‍රතිපාදන මත රු.5,200,000 ක් වැය කර ඉදිකර තිබුණු කඩ කාමර 02 ක් බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණු අතර, කඩ කාමර බදු දීමට පුවත්පත් දැන්වීම් පළකිරීම | කළමනාකරණ කමිටු නිර්දේශ අනුව වසර 03 ක කාලයකට බදුදීමට නියමිත කඩ කාමර සඳහා පුවත්පත් දැන්වීම් පළ කර ඇත. පසුව පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව | නිවැරදි කළමනාකරණ තීරණ ගත යුතුය. |

| | | |
|---|---|---|
| සහ එම දැන්වීම් නැවත අවලංගු කිරීම වෙනුවෙන් රු.116,458 ක් වැය කර තිබුණි. | වසර 25කට කඩ කාමර බදුදීමට තීරණය කර ඇති බැවින් පුවත් පත් දැන්වීම් පළකිරීම හා එය අවලංගු කිරීම සිදු කර ඇති බව. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ජල ව්‍යාපෘති මඟින් පාරිභෝගිකයින් 494 ක් සඳහා ජලය ලබාදී තිබුණු අතර, ජල ව්‍යාපෘති මඟින් 2022 ජනවාරි සිට 2023 සැප්තැම්බර් දක්වා රු.1,959,039 ක ආදායමක් උපයාගෙන තිබුණි. එම කාලය තුළදී ජල ව්‍යාපෘතියේ නඩත්තුව වෙනුවෙන් රු.5,588,951 ක් වැය කර තිබුණි. | මහජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම මූලික වගකීමක් බව සහ ජලයෝජනා ක්‍රමයේ නඩත්තු වියදම් අධිකවීම හේතුවෙන් පිරිවැය ඉහළ ගොස් ආදායම් අඩුවී ඇති බව. | ආදායම් හා වියදම් කළමනාකරණය කරගත යුතුය. |
| (ආ) | 2014 සහ 2015 වර්ෂවලදී “ගමින් ගමට දොරින් දොරට” මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත සමිති 13කට ලබාදී තිබුණු රු.481,487 ක අත්තිකාරම් පියවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂ ගිණුම් වලින් කපා හැරීමට වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීමට කටයුතු කරන බව. | කාර්ය නිමවූ විගසම අත්තිකාරම් පියවා ගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් සහා ගොඩනැඟිල්ලට යාබදව පිහිටි පොළ භූමියේ අංක 01 හා 02 විවෘත කඩ කාමර දෙක එක් කඩ කාමරයක් ලෙසට පෞද්ගලික වියදමින් බිත්ති බැද සංවර්ධනය කර ගැනීමට 2021 මාර්තු 23 දින බදුකරුවකු සමඟ සභාව ගිවිසුමකට එළඹ තිබුණි. පසුව එම බදුකරු සමඟ වසර 03 ක කාලයකට මාසික බදු කුලිය රු.2,500 ක් බැගින් අය කර ගැනීමට 2021 නොවැම්බර් 10 දින නැවත ගිවිසුමකට එළඹ තිබුණි. 2021 වර්ෂයේදී ප්‍රදේශයේ තවත් පාර්ශවකරුවන් 10 ක් පොළ භූමියෙන් ව්‍යාපාරික ස්ථාන ලබා ගැනීමට ඉල්ලීම් කර තිබුණද, එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර, එක් පාර්ශවයකට පමණක් විධිමත් ක්‍රමවේදයකින් බැහැරව කඩ කාමර බදු දී තිබුණි. | බදු කුලී ගිවිසුමක් යටතේ බදු දී කුලී අයකරගෙන යනු ලබන අතර, යථා කාලයේදී එම ස්ථානය සංවර්ධනය කර ටෙන්ඩර් කර බදු දෙන බව. | කඩ කාමර විධිමත්ව තක්සේරුකර බදු දිය යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 05 ක් අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම සහ භාවිතයට නොගැනීම හේතුවෙන් වසරකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අලුත්වැඩියා සිදු කර නොමැති බව. | සභාවට අයත් වාහන අලුත්වැඩියා කටයුතු සිදුකර භාවිතයට ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ට්‍රැක්ටර් 03ක, ට්‍රැක්ටර් ටේලර් 02 ක ලොරියක සහ යතුරුපැදි 03 ක අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් නිරවුල් කරගෙන නොතිබුණි. | කඩිනමින් සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාළ වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |

## 3.6 අවිධිමත් ගණුදෙනු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරුන් 19කට මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා ලෙස රු.105,357 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මහජන නියෝජිතයින් කීපදෙනෙක් මේ වනවිට මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා ගෙවා ඇති අතර, අනෙක් පාර්ශවයන්ට ලිඛිතව දැනුම්දී ඇති බව. | වැඩිපුර ගෙවා තිබුණු මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා කඩිනමින් අය කරගත යුතුය. |
| (ආ) | සභාව සතු කෘෂ කැබ් රථයේ මයිලෝ මීටරය 2021 දෙසැම්බර් මාසයේ සිට 2023 ඔක්තෝබර් දක්වා අක්‍රීයව පැවති අතර, මයිලෝ මීටරය රහිතව කිලෝ මීටර් 36716 ක් දුර ධාවනය කිරීමට ඉන්ධන ලීටර් 4590 ක් භාවිතා කර තිබුණි. | මව් සමාගමෙන් මයිලෝ මීටරය ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව. | කඩිනමින් මයිලෝ මීටරය සවිකර ගත යුතුය. |